# ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

(කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්)

15 OCT 2013

ටී. එම්. කරුණාතිලක (2001/Mphil/5)

540501

(බී. ඒ. අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපනපති)

UCML
540501
University of Colombo Library Sri Lanka

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති විභාගය සඳහා

ඉදිරිපත් කෙරෙන නිබන්ධය

# සාරාංශය

පරිපූර්ණ අධ්‍යාපන ක්‍රියාවලියක පදනම වනුයේ මනා සංවිධිත වූ ප්‍රාථමික අධ්‍යාපනයකි. ළමා අයිතිවාසිකම් සමුළුවේදී හා යුනෙස්කෝ ප්‍රකාශනයේ සඳහන් වී ඇත්තේ අධ්‍යාපනය ලබා ගැනිමට සැම කෙනෙකුටම අයිතියක් ඇති බවත්, ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යය මෙන්ම නොමිලේ ලබා දිය යුතු බවත්ය. සැමට අධ්‍යාපනය යන තේමාවෙන් හඳුන්වා දී ඇත්තේද මූලික හෙවත් ප්‍රාථමික අධ්‍යාපනයයි.

අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයැයි විදාමාන වූ හෙයින් ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියද ප්‍රතිසංස්කරණ ය කෙරිණි. 1998 ගම්පහ දිස්ත්‍රික්කයෙන් නියාමක වශයෙන් ඇරඹි මෙය 1999 දී සමස්ථ ලංකාවේම ක්‍රියාත්මක කෙරිණි. මෙහි මූලික අරමුණ වූයේ සාම්ප්‍රදායි ගුරු කේන්ද්‍රිය ඉගෙනුම් ක්‍රියාවලිය බැහැර කිරීමත් ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිතා කිරීමත් සහ නිපුණතා පාදක කර ගත් කුසලතා සමූහයක් සිසුන්ට අත්කර දිමත්ය. මෙම අධ්‍යයයේ අරමුණ වනුයේද පන්ති කාමරයේ ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිතා වන ආකාරය සොයා බැලීමයි.

ලෝකයේ ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධිතව සිදුකරනු ලැබූ පර්යේෂණ අනාවරණ හා අප ලංකාවේ දැනට මේ හා සම්බන්ධිතව සිදුකරනු ලැබූ අනාවරණයන් 02 වන පරිච්ඡේදයේ සඳහන් කර තිබේ. ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධිතව කරනු ලැබූ අධ්‍යයන බොහොමයක් ඇමරිකාවේ සිදුකරනු ලැබූ ඒවා බව පැහැදිලිය.

අධ්‍යයනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සහ නාගරික පාසල් සියයක පමණ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, නියදියක් ලෙස යොදාගන්නා ලදී. එක් එක් කලාප අධ්‍යාපන කාර්යාල නියෝජනය වන ලෙස ගුරු උපදේශකවරු අධ්‍යාපන අධ්‍යක්ෂකවරු, උපනියැදියක් ලෙස භාවිතා කරනු ලැබිය. සම්මුඛ සාකච්ජාවන් හා පන්ති කාමර නිරීක්ෂණයන්ද දත්ත එක් රැස් කිරීමේදී භාවිතා කරන ලදී. ප්‍රශ්නාවලින්, සම්මුඛ සාකච්ජා නියමාවලින් සහ පන්ති කාමර නිරීක්ෂණ පත්‍රිකා දත්ත එක් රැස්කිරීමේ උපකරණ වශයෙන් භාවිතා කරන ලදී.

සිවුවන පරිච්ජේදයේදී ඉහත පරීක්ෂණ උපකරණ මගින් ලබා ගත් දත්ත වගු හා ප්‍රතිශත වශයෙන් විශ්ලේෂණය කර අර්ථ කථනය කෙරිණි. ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් හඳුන්වාදුන් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිතා කිරීම පිළිබඳවත් නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳවත් විවිධ තොරතුරු මෙමගින් අනාවරණය කර ගැනිමට හැකි විය.මෙම ක්‍රියාවලියේදී උද්ගත වන්නා වූ ගැටළු පිළිබඳවත් අධ්‍යයනයේදී සලකා බැලිණි.

සමස්ථයක් ලෙස ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී විවිධ ගැටළු පවතින බවද මෙම පර්යේෂණයෙන් අනාවරණය කර ගැනීමට හැකි විය.